SC

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතු සඳහා එම පුස්තකාල වලින් ඉටුවන සේවාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ජේ.කේ. ගුණරත්න
LISC/M/06/C



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 486 |
| වර්ග අංකය | |



සමාජීය විද්‍යාපති (පුස්තකාල හා විඥාපන විද්‍යාව) පරීක්ෂණයේ කොටසක් සම්පූර්ණ කිරීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨය වෙත ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධයකි.

1998 සැප්තැම්බර්

## සාරාංශය

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය සඳහා එම පුස්තකාලවලින් ඉටුවන සේවාව ගැන සොයා බැලීම මෙම අධ්‍යයනයේ පරමාර්ථයයි.

විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගෙන් සහ ශිෂ්‍යයන්ගෙන් විශ්වවිද්‍යාල පුස්තකාල සේවා ගැන තොරතුරු ලබා ගැනීමට ප්‍රශ්නාවලි දෙකක් උපයෝගී කර ගතිමි. උතුර නැගෙනහිර හැර අනෙකුත් විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ද ඊය අනුව තෝරා ගත් කොළඹ හා කැලණිය විශ්වවිද්‍යාල සිසුන් 150 ක් අතරද මෙම සමීක්ෂණය මෙහෙය විය.

මෙයට අමතරව සාහිත්‍ය ගවේෂණය මගින් ලබා ගත් තොරතුරු හා දැනුම ඇසුරෙන් විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය හා පුස්තකාල සේවාවන්ගේ ආරම්භය හා විකාශනය විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යයට පුස්තකාල සේවාවල බලපෑම් හෙළිකර ගත හැකි විය.

සමීක්ෂණයෙන් හෙළි වූන කරුණු අතර පුස්තකාල සම්පත් ප්‍රමාණවත් නොවීම, පුස්තකාල ද්‍රව්‍යවල සංවිධානය හා සේවා ගැන උපාධි අපේක්ෂකයන්ට ප්‍රමාණවත් අවබෝධයක් නොවීම, කාර්ය මණ්ඩල ප්‍රමාණවත් නොවීම හා ඔවුන්ට ප්‍රමාණවත් පුහුණුවක් නොදීම පෙන්වා දිය හැක.

මෙම අධ්‍යයනය අනුව විශ්වවිද්‍යාල පුස්තකාල සේවා දියුණු කිරීම සඳහා ගතයුතු ප්‍රධාන පියවර ලෙස පුස්තකාල භාවිතය පිළිබඳ මනා පුහුණුවක් උපාධි අපේක්ෂකයන්ට ලබාදීම, වැඩිවන ශිෂ්‍ය ප්‍රමාණයට සමගාමීව අවශ්‍ය සම්පත් ප්‍රමාණය වර්ධනය කිරීම, පුස්තකාල කටයුතු පරිගණක ගත කොට අන්තර් ජාල සේවා පහසුකම් ඇති කිරීම පෙන්වා දිය හැක. විශේෂයෙන්ම පර්යේෂණ කාර්යයට පහසුකම් සැලැසීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත. ඡායාපිටපත් සේවා සහ ශ්‍රව්‍ය දෘශ්‍ය සේවා දියුණු කිරීම සඳහා පියවර ගත යුතු බවද පෙන්වා දිය හැක.